# විනිමය ගෙන දෙන මිරිදිය ඉස්සන්

ධීවර අමාත්‍යාංශයේ ප්‍රචාරක නිලධාරි

**නිමල් දයාරත්න**

**විසිනි**

කුකුලන්, තාරාවුන්, ඌරන්, එළුවන් සහ ගවයන් තම ගෙවත්තේ ඇතිකර ප්‍රයෝජනයට ගැනීම අනාදිමත් කාලයක් මුළුල්ලේ ලෝකයේ පවතින්නකි. එහෙත් ඉස්සන්, කකුළුවන්, මත්ස්‍යයන් ගෙවත්තේ ඇතිකර කෑමට ගැනීමේ පුරුද්ද වෙනත් රටවල කෙසේ වෙතත් ශ්‍රී ලංකාවට නම් අලුත් දෙයකි.

දිනෙන් දින සීඝ්‍රයෙන් ඉහළ යන ජනගහනය අනුව ඔවුනගේ අවශ්‍යතාවයන් සපුරාලීම පිළිබඳව සමස්ථ ලෝකයේ ම අද මුහුණ පා ඇත්තේ මහත් අර්බුදකාරී තත්ත්වයකටය. මේ තත්ත්වයට මුහුණ දීම සඳහා ජගත් ආහාර සහ කෘෂිකර්ම සංවිධානය වැනි සංවිධාන ගණනාවක් ම දැනට ලෝ පුරා ආහාර නිපිපාදනය සඳහා මහා සටනක් දියත් කර ඇතිමුත් එය කොතෙක් දුරට අනාගත අවශ්‍යතා සඳහා උපකාර වේ දැයි යන්න පිළිබඳව එම සංවිධාන තුලම මහත් සැකයක් පවතී.

ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තයේ වර්ධනය සඳහා මෙන්ම ධීවර කර්මාන්තයේ වර්ධනය සඳහා ජගත් සංවිධාන ගණනාවක් ම උරදී තිබීමෙන් අනාගත ලෝකයට ආහාර සැපයීම පොදු අවශ්‍යතාවයක් බවට පත්වී ඇති බව පැහැදිලි වේ.

මහ මුහුදේත් ගං හෝ ඇල දෙළවලත්, කලපුවලත්, ස්වභාවයෙන් ජීවත්වන ඉස්සන්, කකුළුවන්, හා මසුන් අල්ලා ආහාරයට ගැනීම මේ රටේ පුරුද්දක්ව තිබිණ. නව තාක්ෂණ ක්‍රම අනුව ස්වභාව ධර්මයා ජය ගැනීම සඳහා ලෝකයේ දියුණු ජාතීන් ගෙන යන සටනේ උදර ජයග්‍රහණයක් වශයෙන් කෘත්‍රිම ලෙස ඉස්සන් බෝකර ගෙවත්තේ ඇතිකර ආහාරයට ගැනීමේ ක්‍රමය හඳුන්වා දිය හැකිය. ජපානය තායිලන්තය, ඉන්දියාව වැනි රටවල මෙම ක්‍රමය මගින් එම රටවලට විදේශ විනිමය අද්දවා ගනු ලැබේ.

දේශීය වෙළඳ පොලේ මෙන්ම ලෝක වෙළඳ පොලේ ද ඉස්සන්, කකුළුවන් සහ දැල්ලන්ට විශාල ඉල්ලුමක් තිබේ. ඉකුත් වසරේ සකස් කරන ලද ඉස්සන්, කකුළුවන්, පොකිරිස්සන් සහ දැල්ලන් අපනයනය කිරීමෙන් රුපියල් දශලක්ෂ 600 ක විදේශ විනිමයක් උපයාගෙන ඇති අතර, එය මේ වසරේ රුපියල් දශලක්ෂ 1000 දක්වා වර්ධනය කිරීමට ධීවර අමාත්‍යාංශය පියවර ගෙන ඇත.


එම වැඩ පිළිවෙලේ එක් පියවරක් වශයෙන් ගෘහ කර්මාන්තය වශයෙන් ගෙවතුවල මෙන්ම වාණිජ මට්ටමින් විශාල ගොවිපලවල ඉස්සන් ඇති කිරීමට දැනට කටයුතු යොදා ගෙන යනු ලැබේ. ගෘහ කර්මාන්තයක් වශයෙන් ඉස්සන් බෝකිරීම කරන අයට පර්චස් 20 පොකුණක් සඳහා රු. 2,000 ක්ද හෙක්ටයාර් එකක ඉස්සන් ගොවිපලක් සඳහා රුපියල් 20,000 ක් ද සහනාධාර වශයෙන් සැපයීම ධීවර අමාත්‍යාංශයේ මිරිදිය අංශය කටයුතු යොදා ඇත මෙයට අමතරව ඒ සඳහා අවශ්‍ය ඉස්සන් පැටවුන් සහ තාක්ෂණ දැනුම ධීවර අමාත්‍යාංශය මගින් ලබා දෙනු ලැබේ.

ඉස්සන් පැටවුන් බෝකිරීම සඳහා දැනට හලාවත, පම්බල හා මීගමුව පිටිපන කෘත්‍රිම ආකාරයෙන් ඉස්සන් අභිජනනය කොට බෙදා හැරීමේ මධ්‍යස්ථාන දෙකක් පිහිටුවා ඇත. දැනට මෙම මධ්‍යස්ථානව බෝකරන්නේ මිරිදිය අඩුදිග යෝධ ඉස්සා නමින් හඳුන්වනු ලබන ඉස්සන් වර්ගයය. මෙම ඉස්සන් වර්ගය මිරිදිය ජලාශවල බහුල වශයෙන් වෙසේ. උන් මිරිදිය ජලාශවල සිට බිත්තර දැමීම සඳහා පමණක් කලපුවලට පැමිණේ. මෙම ඉස්සකු ග්‍රෑම් 200 සිට ග්‍රෑම් 500 දක්වා බරය.

ගෘහ කර්මාන්තයක් වශයෙන් මෙන්ම වාණිජ මට්ටමෙන් ඉස්සන් වගා කරන්නන්ට ඉස්සන් පැටවුන් ලබාදීම හලාවත, පම්බල කිවුල්දිය ධීවර මධ්‍යස්ථාන යේදී දැනට සිදුකෙරේ. ඉස්සන් බෝකිරීම සඳහා අවශ්‍ය මව් ඉස්සන් ලබාගන්නේ කලපුවලිනි. කලපු වලින් ලබා ගන්නා මව් ඉස්සන් මනාව සකස් කරන ලද යුත් ටැංකි තුල (ප්‍රමාණවත් ලවන ප්‍රමාණයකින්) බහාලනු ඇත. මව් ඉස්සකු වරකට බිත්තර 500000 ක් පමණ දමනු ලැබේ. මෙම ඉස්සන් බීත්තර රැකීම සිදු කරන්නේ උන්ගේ පසුපස පවල බිත්තරදා රඳවා ගෙනය. දින 18 ක කාලයක් ඇවෑමෙන් මෙම බිත්තර පුපුරා කුඩා කීඩයන් එලියට පැමිණේ. මෙම කාර්යය මුහුදු ජලයෙන් 1/8 ක පමණ ලවන තාවයකින් යුත් ජලාශයේ දින 30 ක් පමණ කාලයක් වෙසේ. ඉන් අනතුරුව අනුක්‍රමයෙන් ජලයේ ලවන තත්ත්වය ඉවත් කොට ජලයේ මෘදු භාවය වැඩිකොට තවත් දින කීපයක් මෙසේ සිටින්නට ඉඩ හරිනු ලැබේ. ඉන් අනතුරුව මාසයක් මාස 1 1/2 ක් අතර, කාලයක් මිරිදියේ වැඩෙන ඉස්සන් පැටවුන් දිගින් අඟලක් පමණ වූ පසු ඉස්සන් වගා කරන්නට බෙදා දෙනු ලැබේ.

හෙක්ටයාර් එකක පමණ පොකුණක් තුල ඉස්සන් 5000 ක් පමණ ඇතිකල හැකිය. මින් පස් මසකට වරක් ඉස්සන් කිලෝ 1000 ක් (ටොන් 1) පමණ ලැබේ. ඉස්සන් කිලෝ එකක් අද දේශීය වෙළඳපලේ රුපියල් 75 ක් පමණ මුදලකට අලෙවි කළ හැකිය. මේ අනුව හෙක්ටයාර් එකක ගොවි පලකින් පස් මසකට රුපියල් 75000 ක් පමණ ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව සැලසේ.






මිරිදිය ධීවර කටයුතු නැංවීම සඳහා රජයේ නව වැඩ පිළිවෙල යටතේ විවිධ තාක්ෂණික ආධාර ලැබේ. ඒවා අතර මත්ස්‍ය පැටවුන් ජලාශ සඳහා ආධාර හා උපකරන ද වෙයි. මේ එබඳු ආධාර ලබන මිරිදිය ධීවර අංශයක මසුන් ඇල්ලීමට සූදානම්වන අවස්ථාවකි.

ඉස්සන් වගා කිරීමේ තවත් වාසියක් වන්නේ උන් සඳහා සපයන ආහාර සඳහා මුදලක් වැය නො වීමය. උන් ආහාර වශයෙන් ගන්නේ අහක දමන මත්ස්‍ය කොටස් සහ සතුන්ගේ ලේ ආදියයි.

ගෘහ කර්මාන්තයක් වශයෙන් කුඩා පොකුණක් තුල (පර්චස් 10 ක පමණ) ඉස්සන් ඇතිකිරීම සඳහා ද ධීවර අමාත්‍යාංශය රුපියල් 2000 ක මුදල් ආධාරයක් සහ තාක්ෂණ නුම ලබාදෙනු ලැබේ. මෙ සඳහා අවශ්‍ය වන්නේ අම්ලබවින් තොර ජලාශයක් පමණි. මෙම ජලාශයක් තුල ඉස්සන් පැටවුන් 250–300 ක් අතර ප්‍රමාණයක් මිය හැකිය. මින් පස්මසකට පසු ඉස්සන් කිලෝ 50 ක් 60 ක් අතර ප්‍රමාණයක් ලබාගත හැකිය. නිවසේ ඉවත දමන ආහාර කොටස් ආහාර වශයෙන් ඉස්සන්ට දිය හැකිය. දැනට පම්බල මධ්‍යස්ථානයේ පමණක් මාසයකට ඉස්සන් පැටවුන් විසිපන්දහසක් පමණ මසකට බෝකර බෙදහැරීම සිදු කෙරේ. එය ලබන වසරේ සිට වසරකට විසි ලක්ෂය දක්වා වැඩිකිරීමේ වැඩ පිළිවෙලක් දැනට ධීවර අමාත්‍යාංශය දියත් කොට ඇත. ඒ සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයේ රුපියල් කෝටි 50 ක වියදමින් අභිජනන මධ්‍යස්ථාන සහ ඉස්සන් ගොවිපලක් පිහිටුවීමට සැලසුම් කොට ඇත.



මිරිදිය මසුන් ඇතිකරන වැවක දර්ශනයක්